28. මහණෙනි, වේදනාවන්ගේ ආදීනවය කවරේ ද? මහණෙනි, යම් හෙයෙකින් වේදනාව අනිත්‍ය ද දුක් ද පෙරළෙනසුලු ද, මේ වේදනාවන්ගේ ආදීනව ය යි.

29. මහණෙනි, වේදනාවන්ගේ නිස්සරණය කුමක් ද? මහණෙනි, වේදනාවන්හි යම් ඡන්දරාග විනයයෙක් වේ ද, ඡන්දරාග ප්‍රහාණියෙක් වේ ද, මෙය වේදනාවන්ගේ නිස්සරණය යි

30. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මෙසේ වේදනාවන්ගේ ආස්වාදය ආස්වාද වශයෙන් ද, ආදීනවය ආදීනව වශයෙන් ද, නිස්සරණය නිස්සරණ වශයෙන් ද තතුසේ නොදනිත් ද, ඔහු ඒකාන්තයෙන් තුමූ හෝ වේදනාවන් පිරිසිද දන්නාහු ය, යම් සේ පිළිපන්නේ වේදනාවන් පිරිසිද දන්නේ නම් එබඳු බව පිණිස මෙරමා හෝ සමාදන් කරවන්නාහු ය යන මේ කාරණය විද්‍යමාන නො වේ. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මෙසේ වේදනාවන්ගේ ආස්වාදය ආස්වාද වශයෙන් ද ආදීනවය ආදීනව වශයෙන් ද නිස්සරණය නිස්සරණ වශයෙන් ද තතුසේ දනිත් ද, ඔහු ඒකාන්තයෙන් තුමූ හෝ වේදනාවන් පිරිසිඳ දන්නාහු ය, යම් සේ පිළිපන්නේ වේදනාවන් පිරිසිඳ දන්නේ නම් එබඳු බව පිණිස මෙරමා හෝ සමාදන් කරවන්නාහු ය යන මේ කාරණය විද්‍යමාන වේ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

**මහාදුක්ඛක්ඛන්ධ සූත්‍රය තෙවැනි යි.**

# 1. 2. 4.

# චූළදුක්ඛක්ඛන්ධ සූත්‍රය.

1. **මා** විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. එසඳ මහානාම සැහැරජ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හින. එකත්පස් වැහුන් මහානාම සැහැරජ භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කෙළේ ය.

2. වහන්ස, "ලොභය චිත්තොපක්ලේශයෙක, ද්වෙෂය චිත්තොපක්ලේශයෙක, මොහය චිත්තොපක්ලේශයෙකැ" යි භගවත්හු විසින් දෙසූ දහම මෙසේ මම දීර්ඝරාත්‍රයෙහි දැන සිටිමි. වහන්ස, "ලොභය චිත්තොපක්ලේශයෙක, ද්වෙෂය චිත්තොපක්ලේශයෙක, මොහය චිත්තොපක්ලේශයෙකැ" යි භගවත්හු දෙසූ දහම මෙසේ මම දන්නෙම් නමුදු, කලෙක ලොභධර්මයෝ ද මා සිත ගෙවා ගෙන සිටුති. ද්වෙෂධර්මයෝ ද මා සිත ගෙවා ගෙන සිටුති. මොහධර්මයෝ ද මා සිත ගෙවා ගෙන සිටුති. වහන්ස. ඒ මට මෙසේ සිතෙක් වෙයි: "යම් හෙයෙකින් කලෙක ලොභධර්මයෝ ද මා සිත පැහැරැ ගෙන සිටිත් ද, ද්වෙෂධර්මයෝ ද මා සිත පැහැරැ ගෙන සිටිත් ද, මොහධර්මයෝ ද මා සිත පැහැරැ ගෙන සිටිත් ද, එහෙයින් කිනම් කෙලෙස්දහමෙක් මා සතන්හි නොපුහුණු වී දෝ හෝ (යන සන්දෙහ සහිත සිත) යි.

3. සො එව ඛො තෙ මහානාම ධම්මො අජ්ඣත්තං අප්පහීනො යෙන තෙ එකදා ලොභධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති, දොසධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති, මොහධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති සො ච හි තෙ මහානාම ධම්මො අජ්ඣත්තං පහීනො අභවිස්ස, න ත්වං අගාරං අජ්ඣාවසෙය්‍යාසි, න කාමෙ පරිභුඤ්ජෙය්‍යාසි. යස්මා ච ඛො තෙ මහානාම සො එව ධම්මො අජ්ඣත්තං අප්පහීනො, තස්මා ත්වං අගාරං අජ්ඣාවසසි, කාමෙ පරිභුඤ්ජසි.

4. අප්පස්සාදා කාමා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති ඉති චෙපි මහානාම අරියසාවකස්ස යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං හොති, සො ච අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි පීතිසුඛං නාධිගච්ඡති අඤ්ඤං වා තතො සන්තතරං, අථ ඛො සො නෙව තාව අනාවට්ටී කාමෙසු හොති.

5. යතො ච ඛො මහානාම අරියසාවකස්ස අප්පස්සාදා කාමා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං හොති, සො ච අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි පීතිසුඛං අධිගච්ඡති අඤ්ඤං වා තතො සන්තතරං, අථ ඛො සො අනාවට්ටී කාමෙසු හොති.

6. මය්හම්පි ඛො මහානාම පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො: "අප්පස්සාදා කාමා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං අහොසි,[1] සො ච අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි පීතිසුඛං නාජ්ඣගමං අඤ්ඤං වා තතො සන්තතරං, අථ ඛ්වාහං නෙව තාව අනාවට්ටී කාමෙසු පච්චඤ්ඤාසිං.

1. හොති, මජසං. සයා.

3. මහානාමය, "යම් හෙයෙකින් කලෙක ලෝභධර්මයෝත් තා සිත පැහැර ගෙන සිටුනාහු වෙත් ද, ද්වේෂධර්මයෝත් තා සිත පැහැර ගෙන සිටුනාහු වෙත් ද, මෝහධර්මයෝත් තා සිත පැහැර ගෙන සිටුනාහු වෙත් ද, එහෙයින් ගෙම ලොභද්වෙෂමොහාඛ්‍යධර්මය තා සතන්හි නොපුහුත් වෙයි. මහානාමය, ඉදින් එ ලොභාදිධර්මය තා සතන්හි ප්‍රහීණ වී නම්, තෝ ගිහිගෙහි බැසගෙන නො වසන්නෙහි. ද්විවිධකාමසම්පතුදු නො වළඳන්නෙහි. මහානාමය, යම් හෙයෙකින් හෙම ලොභාදිධර්මය තා සතන්හි අප්‍රහීණ වේ ද, එහෙයින් තෝ ගෙහි වාස කෙරෙහි. කාමයනුදු වළඳ කෙරෙහි.

4. මහානාමය, ඉදින් ආය්‍ර්‍යශ්‍රාවකයා විසින් "කාමයෝ (පරිත්ත-සුඛ වන බැවින්) අල්පාස්වාදයහ. (ඉහභවයෙහිදු සම්පරායභවයෙහිදු අනන්තදුඃඛදායක වන බැවින්) බහුදුඃඛයහ. ඓහලෞකික පාරලෞකික උපායාසක්ලෙශසාධක වන බැවින්) බහුපායාසයහ. (දෘෂ්ටධාර්මික සාම්ප-රායික උපද්‍රවාධිෂ්ඨාන වන බැවින්) තෙල කාමසම්පතෙහි ආදීනව බෙහෙවැ" යි මෙසෙයින් යථාස්වභාවය මනා නය විසින් ප්‍රඥායෙන් (සොවන් සෙදගැමි දෙමගනැණින්) මනා කොට දක්නා ලදුයේ වෙයි. හෙ අරීසවු දු කාමයන් විනා මැ ලමු අකුසල් දහමුන් විනා මැ ප්‍රීතිසුඛය (සප්‍රීතික දෙ දෘහැන) අධිගම නො කෙරේ ද, ඒ වරා, ශාන්තතර අනෙකක් හෝ (මතු දෙදෘහැන හා දෙමඟ හා) අධිගම නො කෙරේ ද, වැළිත් හෙ එතැත් දක්වා කාමයෙහි අනාවර්ත්ති නො ම වන්නේ යැ. (ආවර්ත්තිත ම වන්නේ ය. සෙසු දෘහැනින් කරන විෂ්කම්භන ප්‍රහාණය හා මතු දෙමගනැණින් කරන සමුච්ඡෙදප්‍රහාණය හා නැති හෙයින.)

5 මහානාමය, යම්කලෙක ආර්‍යශ්‍රාවකයා විසින් "කාමයෝ අල්පා-ස්වාදයහ, බහුදුඃඛයහ, තෙල කාමයෙහි උපද්‍රව බහුලයැ" යි මෙසෙයින් තෙල යථාස්වභාවය මනා නයවිසින් විදර්ශනා ප්‍රඥායෙන්. මොනොවට දක්නා ලදුයේ වේ. හෙ ද කාමයන් විනා මැ අකුසල් දහමුන් විනා ම ප්‍රීතිසුඛය අධිගම කෙරේ ද, එ වරා, ශාන්තතර අනෙකක් හෝ අධිගම කෙරේ ද, එකල හෙ කාමයෙහි අනාවර්ත්ති වෙයි (ලලන නැතියේ වෙයි.)

6. මහානාමය, මාර්‍ගසම්බොධයෙන් පළමු මැ චතුස්සත්‍යාවබොධ නොකළ බෝසත් වැ සිටි මවිසුනු දු "කාමයෝ අල්පාස්වාදයහ, බහුදුඃඛයහ, බහුපායාසයහ, තෙල කාමයෙහි උපද්‍රව බහුලයැ" යි මෙසෙයින් තෙල යථාස්වභාවය මනානයින් (ඇතොරතළුදනා හැරපියන) ප්‍රඥායෙන් මොනොවට දක්නා ලදුයේ වෙයි. මම ද කාමයන් විනා මැ අකුසල් දහමුන් විනා මැ ප්‍රීතිසුඛය අධිගම නො කෙළෙම් වේ ද, එ වරු, ශාන්තතර අනෙකෙක් හෝ (මතු දෙදෘහැන හා සතර මඟ හා) අධිගම නොකෙළෙම් වේද, වැළිත් මම එතැත් දක්වා "කාමයෙහි අනාවර්ත්තියෙමි" යි නො මැ පිළිත කෙළෙමි.

Free Distribution www.aathaapi.org

7. යතො ච ඛො මෙ මහානාම: "අප්පස්සාදා කාමා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං අහොසි, සො ච අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි පීතිසුඛං අජ්ඣගමං අඤ්ඤඤ්ච තතො සන්තතරං, අථාහං අනාවට්ටි කාමෙසු පච්චඤ්ඤාසිං.

8. කො ච මහානාම කාමානං අස්සාදො? පඤ්චිමෙ මහානාම කාමගුණා. කතමෙ පඤ්ච? චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්දා - පෙ - ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා, කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො මහානාම පඤ්ච කාමගුණා. යං ඛො මහානාම ඉමෙ පඤ්ච කාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං කාමානං අස්සාදො.

9. කො ච මහානාම කාමානං ආදීනවො? ඉධ මහානාම කුලපුත්තො යෙන සිප්පට්ඨානෙන ජීවිකං කප්පෙති: යදි මුද්දාය යදි ගණනාය යදි සඞ්ඛානෙන යදි කසියා යදි වණිජ්ජාය යදි ගොරක්ඛෙන යදි ඉස්සත්ථෙන යදි රාජපොරිසෙන යදි සිප්පඤ්ඤතරෙන, සීතස්ස පුරක්ඛතො උණ්හස්ස පුරක්ඛතො, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙහි රිස්සමානො, ඛුප්පිපාසාය මීයමානො. අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

10. තස්ස චෙ මහානාම කුලපුත්තස්ස එවං උට්ඨහතො ඝටතො වායමතො තෙ භොගා නාභිනිප්ඵජ්ජන්ති, සො සොචති කිලමති පරිදෙවති, උරත්තාළිං කන්දති, සම්මොහං ආපජ්ජති: "මොඝං වත මෙ උට්ඨානං. අඵලො වත මෙ වායාමොති". අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

11. තස්ස චෙ මහානාම කුලපුත්තස්ස එවං උට්ඨහතො ඝටතො වායමතො තෙ භොගා අභිනිප්ඵජ්ජන්ති, සො තෙසං භොගානං ආරක්ඛාධිකරණං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති: "කින්ති මෙ භොගෙ නෙව රාජානො හරෙය්‍යුං, න චොරා හරෙය්‍යුං, න අග්ගි ඩහෙය්‍ය, න උදකං වහෙය්‍ය, න අප්පියා දායාදා හරෙය්‍යුන්ති".

7. මහානාමය, යම්කලෙක "කාමයෝ අල්පාස්වාදයහ, බහුදුඃඛයහ, බහූපායාසයහ, මෙහි කාමයෙහි උපද්‍රව බහුල යැ" යි මෙසෙයින් මෙය යථාස්වභාවය මනා නයින් ප්‍රඥායෙන් දක්නා ලදුයේ වී ද, මම ද කාමයන් විනාමැ අකුසල් දහමුන් වීනා මැ ප්‍රීතිසුඛය අධිගම කෙළෙම් වෙම් ද, එ වරා ශාන්තතර අනෙකක් හෝ අධිගම කෙළෙම් වෙම් ද, එකල මම "කාමයෙහි අනාවර්තීයෙමි" යි පිළිත කෙළෙමි.

8. මහානාමය, කාමයන්ගේ ආස්වාද කවරේ ය? මහානාමය, මෙ කාමගුණයෝ පස් දෙනෙකි. කවර පස්දෙනක යත්: ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියජාතික වූ කාමෝපසංහෘත වූ සිත්රඳනට නිසි වූ චක්ෂුර් විඥෙය රූපායතනයෝ ය... ශ්‍රොත්‍රවිඥෙය ශබ්දායතනයෝ ය... ඝ්‍රාණවිඥෙය ගන්ධායතනයෝ ය... ජිහ්වාවිඥෙය රසායතනයෝ ය, ඉෂ්ටාරම්මණවූ, මනාපවූ, ප්‍රියරූපවූ, කාමෝපසංහෘතවූ, රජනීයවූ, කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යායතනයෝ ය. මහානාමය, මොහු පඤ්චකාමගුණයෝ යි. මහානාමය, මෙ පස්කම්ගුණ පිණිස යම් සුඛයෙක් හෝ සොම්නසෙක් හෝ උපදනේ වේ ද මෙ කාමයන්ගේ ආස්වාද නම් වෙයි.

9. මහානාමය, කාමයන්ගේ ආදීනව කවරේ ය? මහානාමය, මෙලොවැ කුලපුත්‍රයෙක් හස්තමුද්‍රායෙන් වේව යි, ගණනායෙන් වේව යි, පිණ්ඩ-ගණනායෙන් වේව යි, කෘෂිකර්මයෙන් වේව යි, වෙණෙඳාමෙන් වේව යි, ගොරක්ෂායෙන් වේව යි, අවි වටනින් වේව යි, රාජපුරුෂකර්මයෙන් වේව යි, ශීතයට පුරඃසෘත වැ (ශීතයට පෙරට වැ) උෂ්ණයට පුරඃසෘත වැ මැසි මදුරු වාසුළුහසපු යන මුත්ගේ දළපහසින් ගැටෙමින් සාපවසින් මියමින් යම්මැ ශිල්පයෙකින් දිවිවැටුම කෙරෙයි. මහානාමය, කාමයන් පිළිබඳ මේ ආදීනවය. ප්‍රත්‍යක්ෂ දුක්රැසෙක. කාමයන් ප්‍රත්‍යය කොට ගෙන ඇත. කාමයන් මුල් කොට ගෙන ඇත. කාමයන් කාරණ කොටගෙන ඇත. කාමයන් පිළිබැඳි මැ හෙතු ඇති වෙයි.

10. මහානාමය, ඉදින් මෙසෙයින් (ආජීවසමුත්ථාපක ව්‍යායාමයෙන් උසා කරන, (පූර්වාපරව්‍යායාමය) ඝටනා කරන, ඵලනිෂ්පත්ති සඳහා පියෝ කරන, ඒ කුලපුත්හට ඒ භොගයෝ පලඳුවිසින් අභිනිෂ්පත්ති නො කෙරෙත් නම්, හෙ සොස්නේ ය. කලු කිරෙත්නේ ය. වලප්නේ ය. ලම්බියෙහි අත් පුනපුනා පැහැර හඬත්තේ ය. (විසංඥයකු සෙයින්) සම්මොහයට වදනේ ය. කෙසේ ය යත්: "එකැතින් මා උසා සිස් වී. එකැතින් මං උසා අඵල වී" කියා යි. මහානාමය, කාමයන්ගේ මේ ආදීනවය. ප්‍රත්‍යක්ෂ දුක්රැසෙකැ. කාමයන් ප්‍රත්‍යය කොට ගෙන ඇත. කාමයන් මුල් කොට ගෙන ඇත. කාමයන් කාරණ කොටගෙන ඇත. කාමයන් මැ හෙතු කොට ගෙන පවත්නේ ය

11. මහානාමය, ඉදින් මෙසෙයින් උසා කරන, ඝටනා කරන, පියෝ කරන, ඒ කුලපුත්‍රයාහට ඒ භොගයෝ පලඳ විසින් නිපදින් නම්, හෙ ඒ භොගයන්ගේ ආරක්ෂා කාරණ කොට ගෙන දුක් දොම්නස් වලඳ කෙරෙයි. කෙසේය යත්: "කිනම් උපායෙකින් මා අයත් භොගයන් රජදරුවෝ නො ම ගෙන යෙත් ද, සොරු නොගෙන යෙද් ද, ගිනි නො දවා ද, දිය උල්පවා නො වහා ද, අප්‍රියදායාදයෝ නො නෙරත් ද" කියා යි.

12. තස්ස එවං ආරක්ඛතො ගොපයතො තෙ භොගෙ රාජානො වා හරන්ති. චොරා වා හරන්ති. අග්ගි වා ඩහති. උදකං වා වහති. අප්පියා වා දායාදා හරන්ති. සො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති: යම්පි මෙ අහොසි තම්පි නො නත්ථීති. අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

13. පුන ච පරං මහානාම කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු රාජානොපි රාජූහි විවදන්ති. ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති. බ්‍රාහ්මණාපි බ්‍රාහ්මණෙහි විවදන්ති. ගහපතීපි ගහපතීහි විවදන්ති. මාතාපි පුත්තෙන විවදති. පුත්තොපි මාතරා විවදති. පිතාපි පුත්තෙන විවදති. පුත්තොපි පිතරා විවදති. භාතාපි භාතරා විවදති. භාතාපි භගිනියා විවදති. භගිනීපි භාතරා විවදති. සහායොපි සහායෙන විවදති. තෙ තත්ථ කලහවිග්ගහවිවාදාපන්නා අඤ්ඤමඤ්ඤං පාණීහිපි උපක්කමන්ති. ලෙඩ්ඩූහිපි උපක්කමන්ති. දණ්ඩෙහිපි උපක්කමන්ති. සත්ථෙහිපි උපක්කමන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං. අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු

14. පුන ච පරං මහානාම කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා උභතො වියූළ්හං සඞ්ගාමං පක්ඛන්දන්ති උසූසුපි ඛිප්පමානෙසු සත්තීසුපි ඛිප්පමානාසු අසීසුපි විජ්ජොතලන්තෙසු. තෙ තත්ථ උසූහිපි විජ්ඣන්ති, සත්තියාපි විජ්ඣන්ති, අසිනාපි සීසං ඡින්දන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං. අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

15. පුන ච පරං මහානාම කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා අද්දාවලෙපනා[1] උපකාරියො පක්ඛන්දන්ති උසූසුපි ඛිප්පමානෙසු සත්තීසුපි ඛිප්පමානාසු අසීසුපි විජ්ජොතලන්තෙසු. තෙ තත්ථ උසූහිපි විජ්ඣන්ති, සත්තියාපි විජ්ඣන්ති, පක්කට්ඨියාපි[2] ඔසිඤ්චන්ති, අභිවග්ගෙනපි ඔමද්දන්ති, අසිනාපි සීසං ඡින්දන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං. අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු

1. අට්ටාවලෙපනා, ස්‍යා 2. ඡකණකායපි, මජසං.

Free Distribution www.aathaapi.org

12. මෙසෙයින් ආරක්‍ෂා කරන, ගොපනා කරන, උහුගේ ඒ භොගයන් රජදරුවෝ ගෙන යෙත්. සොරු හෝ ගෙන යෙත්. ගිනි හෝ දවයි. දිය හෝ පා කෙරෙයි. අප්‍රිය දායාදයෝ හෝ හෙරත්. හෙ සොස්තේ ය, කලකිරෙන්නේ ය, වලප්නේ ය, ළමිඹියෙහි අත් පැහැර හඩන්නේ ය, සමෙමාහයට වදනේ ය. කෙසේය යත්: "යම් ධනයෙක් මට වී ද, එ ද අපට නැති වී" කියා යි. මහානාමය, මෙද කාමයන්ගේ ආදීනවය, ප්‍රත්‍යක්‍ෂ දුක් රැසෙකැ. කාමයන් ප්‍රත්‍යය කොට ගෙන ඇත. කාමයන් මූල්කොට ගෙන ඇත. කාමයන් කාරණ කොට ගෙන ඇත. කාමයන් මැ හෙතු කොට ගෙන පවත්නේ ය.

13. තවද මහානාමය, කාමප්‍රත්‍යයයෙන් කාමයන් නිදාන කොට, කාමයන් කරණ කොට, කාමයන් මැ හෙතු කොට රජදරුවෝ ද රජදරුවන් හා විරුද්ධ වාද කෙරෙත්. ක්‍ෂත්‍රියයෝ ද ක්‍ෂත්‍රියයන් හා විවාද කෙරෙත්. බමුණෝ ද බමුණන් හා විවාද කෙරෙත්. ගැහැවියෝ ද ගැහැවියන් හා විවාද කෙරෙත්. මවුදු පුතු හා විවාද කෙරෙයි. පිත් ද මවු හා විවාද කෙරෙයි. සොහොවුරු දු සොහොවුරු හා විවාද කෙරෙයි. සොහොවුරු දු බින්හැඹු හා විවාද කෙරෙයි. බින්හැඹු දු බෑයා හා විවාද කෙරෙයි. යහළු දු යහළු හා විවාද කෙරෙයි. ඔහු එහි කලහවිරුද්ධ–ග්‍රහණ – විරුද්ධවාදයට අවත්නාහු උහුන් අතිනුදු පහරත්. කැටිනුදු පහරත්. දඩියෙනු දු පහරත්. සැතිනුදු පහරත්. ඔහු එහි දී මරණයට ද මරණමාත්‍ර දුඃඛයට ද යෙති. මහානාමය, කාමයන්ගේ මෙද ආදීනවය. ප්‍රත්‍යක්‍ෂ දුක් රැසෙකැ. කාමයන් ප්‍රත්‍යය කොට ගෙන ඇත. කාමයන් මුල් කොට ගෙන ඇත. කාමයන් කාරණ කොට ගෙන ඇත. කාමයන් මැ හෙතු කොට ගෙන පවත්නේ ය.

14 තවද මහානාමය, කාමප්‍රත්‍යයයෙන් කාමයන් නිදාන කොට, කාමයන් කරණ කොට, කාමයන් මැ හෙතු කොට සර ද විදුතා ලබත් මැ සිරිය ද වුහුටත් මැ කඩුදු ඔබමොබ පෙරෙලා වැටෙත් මැ කඩුපලිහ ගෙන, දුනු හියොවුරු සකසා බැඳ, දෙපසින් මුළුදුන් සඞ්ග්‍රාමයට පිවිසෙති. ඔහු එහි දි ඊයෙනුදු විදිත්. සිරියෙනුදු විදිත්. කඩුයෙනුදු හිස් සිඳිත්. ඔහු එහි දී මරණයට ද මරණමාත්‍ර දුඃඛයට ද යෙයි. මහානාමය, කාමයන්ගේ මෙද ආදීනවය. ප්‍රත්‍යක්‍ෂ දුක්රැසෙකැ. කාමයන් ප්‍රත්‍යය කොට ගෙන ඇත. කාමයන් මුල් කොට ගෙන ඇත. කාමයන් කාරණ කොටගෙන ඇත. කාමයන් හෙතු කොට ගෙන පවත්නේ ය.

15. තවද මහානාමය, කාමප්‍රත්‍යයයෙන් කාමයන් නිදාන කොට, කාමයන් කරණ කොට කාමයන් මැ හෙතු කොට, සර ද විදුතා ලබත් මැ සිරිය ද වුහුටත් මැ කඩුදු ඔබ මොබ පෙරෙලා වැටෙත් මැ කඩුපලිහ ගෙන, දුනු හියොවුරු සකසා බැඳ තෙත්කලල් අලෙවු දුන් පවුරු පදනමට පැනැ ගනිත්. ඔහු එහි දී ඊයෙනුදු විදිත්. සිරියෙනුදු විදිත්. කකියන ගොම්නු දු තෙමත් ශත දන්තයෙනුදු අවමර්දීන කෙරෙත්. කඩුයෙනුදු හිස් සිඳිත්. ඔහු එහි දී මරණයට ද මරණමාත්‍ර දුඃඛයට ද යෙත් මහානාමය, මෙ ද කාමයන්ගේ ආදිනවය වෙයි. සාංදෘෂ්ටික දුක්රැසෙකැ. කාමයන් ප්‍රත්‍යය කොට ඇති වෙයි. කාමයන් කාරණ කොට ඇති වෙයි. කාමයන් පිළිබැඳි මැ හෙතු ඇතියේ වෙයි.

16. පුන ච පරං මහානාම කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු සන්ධිම්පි ඡින්දන්ති, නිල්ලොපම්පි හරන්ති, එකාගාරිකම්පි කරොන්ති, පරිපන්ථෙපි තිට්ඨන්ති, පරදාරම්පි ගච්ඡන්ති. තමෙනං රාජානො ගහෙත්වා විවිධා[1] කම්මකාරණා[2] කාරෙන්ති: කසාහිපි තාළෙන්ති, වෙත්තෙහිපි තාළෙන්ති, අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙන්ති, හත්ථම්පි ඡින්දන්ති, පාදම්පි ඡින්දන්ති, හත්ථපාදම්පි ඡින්දන්ති, කණ්ණම්පි ඡින්දන්ති, නාසම්පි ඡින්දන්ති, කණ්ණනාසම්පි ඡින්දන්ති, බිලඞ්ගථාලිකම්පි කරොන්ති, සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්ති, රාහුමුඛම්පි කරොන්ති, ජොතිමාලිකම්පි කරොන්ති, හත්ථපජ්ජොතිකම්පි කරොන්ති, එරකවත්තිකම්පි කරොන්ති, චීරකවාසිකම්පි කරොන්ති, එණෙය්‍යකම්පි කරොන්ති, බළිසමංසිකම්පි කරොන්ති, කහාපණිකම්පි කරොන්ති, ඛාරාපතච්ඡිකම්පි කරොන්ති, පලිඝපරිවත්තිකම්පි කරොන්ති, පලාලපීඨකම්පි කරොන්ති, තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති, සුනඛෙහිපි ඛාදාපෙන්ති, ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති, අසිනාපි සීසං ඡින්දන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං. අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

17 පුන ච පරං මහානාම කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු කායෙන දුච්චරිතං චරන්ති, වාචාය දුච්චරිතං චරන්ති, මනසා දුච්චරිතං චරන්ති. තෙ කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. අයං මහානාම කාමානං ආදීනවො සම්පරායිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

18. එකමිදාහං මහානාම සමයං **රාජගහෙ** විහරාමි **ගිජ්ඣකූටෙ** පබ්බතෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා නිගණ්ඨා **ඉසිගිලිපස්සෙ** කාළසිලායං උබ්භට්ඨකා හොන්ති ආසනපටික්ඛිත්තා. ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති. අථ ඛොහං මහානාම සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන ඉසිගිලි පස්සෙ කාළසිලා යෙන තෙ නිගණ්ඨා තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා තෙ නිගණ්ඨෙ එතදවොචං: කින්නු තුම්හෙ ආවුසො නිගණ්ඨා, උබ්භට්ඨකා ආසනපටික්ඛිත්තා ඔපක්කමිකා තිප්පා කටුකා වෙදනා වෙදියථාති? එවං වුත්තෙ මහානාම තෙ නිගණ්ඨා මං එතදවොචුං: නිගණ්ඨො ආවුසො **නාථපුත්තො** සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානාති: චරතො ච මෙ තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඤාණදස්සනං පච්චුපට්ඨිතන්ති -

1. විවිධානි, 2. කම්මකාරණානි, සයා.

16. තවද මහානාමය, කාමප්‍රත්‍යයයෙන් කාමයන් නිදාන කොට, කාමයන් කරණ කොට, කාමයන් මැ හෙතු කොට, උමඟ ද සිඳිත්. නිර්ලොප (ගම්පැහැරීම්) කොට තෙරත්. ජීවග්‍රාහයෙන් ගෙනැ ධන තෙරීම් ද කෙරෙත්. මඟනැඟීමෙහිදු සිටිත් පරඹුත් කරා ද යෙති. රජ-දරුවෝ උහු ගෙන විවිධ කම්කටොලු කෙරෙති: කටුමතිගායෙනු දු තලත්. වේවැලිනුදු තලත්. අත ද සිඳිත්. පය ද සිඳිත්. අත්පා ද සිඳිත්. කන ද සිඳිත්. නැහැය ද සිඳිත්. කන්නැහැ ද සිඳිත්. බිලඞ්ගථාලිකවධ ද කෙරෙත්. සඞ්ඛමුණ්ඩිකවධ ද කෙරෙත්. රාහු-මුඛවධ ද කෙරෙත්. ජොතිමාලිකවධ ද කෙරෙත්. හත්‍ථපජ්ජොතිකවධ ද කෙරෙත්. එරකවත්තිකවධ ද කෙරෙත්. චීරකවාසිකවධ ද කෙරෙත්. එණෙය්‍යකවධ ද කෙරෙත්. බළිසමංසිකවධ ද කෙරෙත්. කහාපණක වධ ද කෙරෙත්. ඛාරාපතච්ඡිකවධ ද කෙරෙත්. පලිඝපරිවත්තිකවධ ද කෙරෙත්. පලාලපීඨකවධ ද කෙරෙත්. තප්තතෙලයෙනුදු තෙමත්. කිණිබල්ලන් ලවා කවත්. දිවස් හුලැ හිඳුවත්. කඩුයෙනුදු හිස් සිඳිත්. ඔහු එහි දී මරණයට ද වැදගනිත්. මරණමාත්‍රදුඃඛයට ද යෙත්. මහානාමය, මෙද කාමාදීනවය, සාන්දෘෂ්ටික දුඃඛස්කන්ධයෙකැ. කාමයන් ප්‍රත්‍යය කොට ගෙන ඇත. කාමයන් මුල් කොට ගෙන ඇත. කාමයන් කාරණ කොට ගෙන ඇත. කාමයන් පිළිබැඳි මැ හෙතු ඇතියේ වෙයි.

17. තවද මහානාමය, කාමප්‍රත්‍යයයෙන් කාමයන් නිදාන කොට කාමයන් කරණ කොට, කාමයන් මැ හෙතුකොට, කයින් දුසිරිත් කරත්.වචනයෙන් දුසිරිත් කරත්. සිතින් දුසිරිත් කරත්. ඔහු කයින් දුසිරිත් පුරා, වචනයෙන් දුසිරිත් පුරා, සිතින් දුසිරිත් පුරා, කාබුන් මරණින් මතු සැපයෙන් වෙන් ව සිටුනා තපුරුගතියක් වන විවසව වැ වැටෙන තැන් වන නිරයට එළඹෙත්. මහානාමය, මෙ කාමාදීනවය සාම්පරායිකදුඃඛ ස්කන්ධයෙකි. කාමයන් ප්‍රත්‍යය කොට ඇත. කාමයන් මුල් කොට ඇත. කාමයන් කාරණ කොට ඇත. කාමයන් පිළිබැඳි මැ හෙතු ඇතියේ වෙයි.

18. මහානාමය, මම එක් කලෙක මේ රජගහ නුවර ගිජුකුළු පව්වෙහි විසීමි. එසමයෙහි නුවටහු බොහෝ දෙනෙක් ඉසිගිලිපව් ඇලයෙහි කළුගල් අතලෙහි පියතලද අසුන් ඇති වැ නැඟිට සිටියාහු වෙති. (සප්‍රානාදි)උපක්‍රමයෙන් වන තීව්‍ර කටුක දුඃඛවෙදනාවන් විඳිත්. මහානාමය,මම එසඳ සවස්වරුයෙහි පිළිසලනින් නැගිටියෙමි ඉසිගිලි ඇලයෙහි කළු ගල් අතල වෙත එනුවටුන් කරා එළැඹියෙමි. එළඹ එ නුවටුනට තෙල බස් කියෙමි: ‘ඇවැත්නි, නිගණ්ඨයෙනි, කවර කාරුණින් තෙපි පියු අසුන් ඇති වැ නැඟිට සිටිනහු තිව්‍ර කටුක ඖපක්‍රමික දුඃඛවෙදනාවන් විඳුනාව ? කියා යි. මහානාමය, මෙසේ කී කල, ඒ නුවටහු මට තෙල බස් කී “ඇවැත්නි, නාතපුත්ත නුවට (අපු අනා වත්මන්) හැම දත්තෙකැ හැම දක්නාසුල්ලෙකැ. අපරිශෙෂ සඞ්ඛ්‍යාත ඥානදර්ශනය පිළිත කෙරෙයි: ඇවිදුනු වූ ද, සිටුනු වූ ද, නිදනු වූ ද, නිදිවරනු වූ ද, මට හැමකල් නිරතුරු ඥානදර්ශනය එළඹ සිටුනේ ය කියා” යි.-

සො එවමාහ: ''අත්ථි වො නිගණ්ඨා, පුබ්බෙ පාපං කම්මං කතං. තං ඉමාය කටුකාය දුක්කරකාරිකාය නිජ්ජරෙථ. යං පනෙත්ථ එතරහි කායෙන සංවුතා වාචාය සංවුතා මනසා සංවුතා තං ආයතිං පාපස්ස කම්මස්ස අකරණං. ඉති පුරාණානං කම්මානං තපසා ව්‍යන්තීභාවා, නවානං කම්මානං අකරණා ආයතිං අනවස්සවො. ආයතිං අනවස්සවා කම්මක්ඛයො. කම්මක්ඛයා දුක්ඛක්ඛයො. දුක්ඛක්ඛයා වෙදනාක්ඛයො. වෙදනාක්ඛයා සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී''ති. තඤ්ච පනම්හාකං රුච්චති චෙව ඛමති ච තෙන චම්හා අත්තමනාති

19. එවං වුත්තෙ අහං මහානාම තෙ නිගණ්ඨෙ එතදවොචං: කිම්පන තුම්හෙ ආවුසො නිගණ්ඨා ජානාථ: 'අහුවම්හෙව මයං පුබ්බෙ න නාහුවම්හාති? නො හිදං ආවුසො. කිම්පන තුම්හෙ ආවුසො නිගණ්ඨා ජානාථ: අකරම්හෙව මයං පුබ්බෙ පාපං කම්මං. නාකරම්හාති? නො හිදං ආවුසො. කිම්පන තුම්හෙ ආවුසො නිගණ්ඨා ජානාථ: එවරූපං වා පාපං කම්මං අකරම්හාති? නො හිදං ආවුසො. කිම්පන තුම්හෙ ආවුසො නිගණ්ඨා ජානාථ: එත්තකං වා දුක්ඛං නිජ්ජිණ්ණං. එත්තකං වා දුක්ඛං නිජ්ජරෙතබ්බං, එත්තකම්හි වා දුක්ඛෙ නිජ්ජිණ්ණෙ සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතීති? නො හිදං ආවුසො. කිම්පන තුම්හෙ ආවුසො නිගණ්ඨා ජානාථ: දිට්ඨෙව ධම්මෙ අකුසලානං ධම්මානං පහානං, කුසලානං ධම්මානං උපසම්පදන්ති? නො හිදං ආවුසො. ඉති කිර තුම්හෙ ආවුසො නිගණ්ඨා න ජානාථ: අහුවම්හෙව මයං පුබ්බෙ න නාහුවම්හාති. න ජානාථ: අකරම්හෙව මයං පුබ්බෙ පාපං කම්මං න නාකරම්හාති. න ජානාථ: එවරූපං වා එවරූපං වා පාපං කම්මං අකරම්හාති. න ජානාථ: එත්තකං වා දුක්ඛං නිජ්ජිණ්ණං, එත්තකං වා දුක්ඛං නිජ්ජරෙතබ්බං, එත්තකම්හි වා දුක්ඛෙ නිජ්ජිණ්ණෙ සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතීති. න ජානාථ: දිට්ඨෙව ධම්මෙ අකුසලානං ධම්මානං පහානං කුසලානං ධම්මානං උපසම්පදං. එවං සන්තෙ ආවුසො නිගණ්ඨා යෙ ලොකෙ ලුද්දා ලොහිතපාණිනො කුරූරකම්මන්තා මනුස්සෙසු පච්චාජාතා, තෙ නිගණ්ඨෙසු පබ්බජන්තීති.

20. න ඛො ආවුසො ගොතම සුඛෙන සුඛං අධිගන්තබ්බං, දුක්ඛෙන ඛො සුඛං අධිගන්තබ්බං. සුඛෙන ච හාවුසො ගොතම සුඛං අධිගන්තබ්බං අභවිස්ස, රජා මාගධො සෙනියො බිම්බිසාරො සුඛං අධිගච්ඡෙය්‍ය. රජා මාගධො සෙනියො බිම්බිසාරො සුඛවිහාරිතරො ආයස්මතා ගොතමෙනාති.

හෙ මෙසේ කියයි: “නුවටුනි, පෙරැ තොප කළ පාපකර්ම ඇත. එපව් මේ කටුක දුෂ්කරක්‍රියායෙන් දිරවා ලව. යම් කරුණකින් මෙහි දැන් කාවිසිමුති තුන් තැනින් සංවෘත වව් ද, එකරුණ මතුයෙහි පාපකර්මයාගේ නොකිරීම වෙයි. මෙසේ පුරාණ කර්මයන් තපසින් තැවී අවසන් වීමෙනුදු, නවකර්මයන් නො කිරීමෙනු දු මතුයෙහි ආස්‍රව(කර්ම රැස් කිරීමෙක්) නො වෙයි. මතුයෙහි අනාස්‍රව හෙතුයෙන් කර්මක්ෂය වෙයි කර්මක්ෂය හෙතුයෙන් දුඃඛක්ෂය වෙයි දුඃඛක්ෂය හෙතුයෙන් වෙදනාක්ෂය වෙයි. වෙදනාක්ෂය හෙතුයෙන් හැම දුක් නිර්ජීර්ණ වෙයි.” එද වනාහි අපට රුස්නේ යැ. සහනු ද වෙයි. එයිනුදු අපි සතුටු වම්හ යි.

19 මහානාමය, මෙසේ කීකල මම ඒ නුවටුනට තෙල කීයෙමි: ඇවැත්නි, නුවටුනි, “අපි පෙර වූමෝ ම යැ. නුවූමෝ නො වූම්හ”යි කිම තෙපි දන්නා ව? ඇවැත්නි, මෙසේ අපි නොදනුම්හ. ඇවැත්නි නුවටුනි, “අපි පෙර පව්කම් කළාවමෝ ම යැ. නොකළාවමෝ නො වූම්හ” යි කිම තෙපි දන්නා ව? ඇවැත්නි, මෙ ද නොදනුම්හ. ඇවැත්නි, නුවටුනි, “මෙවත් මෙවත් පව්කම් කළාවමෝ” යි කිම තෙපි දන්නා ව? ඇවැත්නි, මෙ ද නොදනුම්හ. ඇවැත්නි. නුවටුනි, “මෙතෙක් හෝ දුක් දිරිණ. මෙතෙක් හෝ දුක් දිරවිය යුතුය. මෙතෙක් හෝ දුක් දිරුණුකල දුක් හැම නිර්ජීර්ණ වනුයේ” යි කිම තෙපි දන්නා ව? ඇවැත්නි, මෙ ද නොදනුම්හ. ඇවැත්නි, නුවටුනි, “මෙ ලොව්හි මැ අකුශලධර්මයන්ගේ ප්‍රහාණය හා කුශලධර්මයන්ගේ උපසම්පත් හා වෙති ”යි කිම තෙපි දන්නා ව? ඇවැත්නි, මෙ ද නොදනුම්හ. ඇවැත්නි, නුවටුනි, මෙසෙයින් තෙපි “පෙර වූවෝ මය, නුවූවෝ නො වූම්හ” යි නො දනුව. “අපි පෙර පව්කම් කළාවමෝ ම යැ, නොකළාවමෝ නො වූම්හ” යි නො දනුව. “මෙවත් මෙවත් පව්කම් කළාවමෝ” යි නො දනුව. “මෙතෙක් හෝ දුක් දිරිණ. මෙතෙක් හෝ දුක් දිරවිය යුතු ය. මෙතෙක් හෝ දුක් දිරුණු කලැ දුක් හැම නිර්ජීර්ණ වනුයේ ”යැ යි නො දනුව. “මෙ ලොව්හි මැ අකුශලධර්මයන්ගේ ප්‍රහාණය හා කුශලධර්මයන්ගේ උපසම්පත් හා වෙති” යි නො දනුව. ඇවැත්නි, නුවටුනි, මෙසේ වන් මැ, ලොකයෙහි රෞද්‍ර, ලෙහෙයෙන් වැකුණු අත් ඇති, කැකුළුකම් ඇති, මිනිසුන් කෙරෙහි උපන් යම් කෙනෙක් ඇත් ද, ඔහු නුවටුන් කෙරෙහි පැවිදි වෙති.

20. ඇවැත්නි, ගොයුම් ගොතුවෙනි, සුඛයෙන් සුඛය අධිගන්තව්‍ය (ලැබිය යුතු) නොවේ. දුඃඛයෙන් මැ සුඛය අධිගන්තව්‍ය වේ. ඇවැත්නි, ගොයුම්ගොතුවෙනි, සුඛයෙන් සුඛය අධිගන්තව්‍ය වේ නම්, මගධෙශ්වර වන, සෙනා ඇති, දකුම්කලු අත් බැව් ඇති බිම්සර රජ සුඛය ලබන්නේ යැ. මහධෙශ්වර වන බිම්බිසාර සෙනිය රජ අංයුෂ්මත් ගොයුම්ගොතුවනට වඩා අත්‍යර්ථයෙන් සුඛවිහාර ඇතියේ යැ.

21. අද්ධායස්මන්තෙහි නිගණ්ඨෙහි සහසා අප්පටිසඞ්ඛා වාචා භාසිතා: “න ඛො ආවුසො ගොතම, සුඛෙන සුඛං අධිගන්තබ්බං. දුක්ඛෙන ඛො සුඛං අධිගන්තබ්බං. සුඛෙන ච හාවුසො ගොතම, සුඛං අධිගන්තබ්බං අභවිස්ස, රාජා මාගධො සෙනියො බිම්බිසාරො සුඛං අධිගච්ඡෙය්‍ය. රාජා මාගධො සෙනියො බිම්බිසාරො සුඛවිහාරිතරො ආයස්මතා ගොතමෙනා”ති.

22. අපි ච අහමෙව තත්ථ පටිපුච්ඡිතබ්බො: කො නු ඛො ආයස්මන්තානං සුඛවිහාරිතරො රාජා වා මාගධො සෙනියො බිම්බිසාරො ආයස්මා වා ගොතමොති?

23. අද්ධාවුසො ගොතම අම්හෙහි සහසා අප්පටිසඞ්ඛා වාචා භාසිතා: “න ඛො ආවුසො ගොතම සුඛෙන සුඛං අධිගන්තබ්බං. දුක්ඛෙන ඛො සුඛං අධිගන්තබ්බං සුඛෙන ච හාවුසො ගොතම, සුඛං අධිගන්තබ්බං අභවිස්ස, රාජා මාගධො සෙනියො බිම්බිසාරො සුඛං අධිගච්ඡෙය්‍ය. රාජා මාගධො සෙනියො බිම්බිසාරො සුඛවිහාරිතරො ආයස්මතා ගොතමෙනා”ති. අපි ච තිට්ඨතෙතං, ඉදානිපි මයං ආයස්මන්තං ගොතමං පුච්ඡාම: කො නු ඛො ආයස්මන්තානං සුඛවිහාරිතරො රාජා වා මාගධො සෙනියො බිම්බිසාරො ආයස්මා වා ගොතමොති?

24. තෙන හාවුසො නිගණ්ඨා තුම්හෙව තත්ථ පටිපුච්ඡිස්සාමි. යථා වො ඛමෙය්‍ය, තථා නං බ්‍යාකරෙය්‍යාථ: තං කිං මඤ්ඤථාවුසො නිගණ්ඨා, පහොති රාජා මාගධො සෙනියො බිම්බිසාරො අනිඤ්ජමානො කායෙන අභාසමානො වාචං සත්ත රත්තින්දිවානි එකන්තසුඛපටිසංවෙදී[1] විහරිතුන්ති? නො හිදං ආවුසො. තං කිං මඤ්ඤථාවුසො නිගණ්ඨා, පහොති රාජා මාගධො සෙනියො බිම්බිසාරො අනිඤ්ජමානො කායෙන අභාසමානො වාචං ඡ රත්තින්දිවානි -පෙ- පඤ්ච රත්තින්දිවානි -පෙ- චත්තාරි රත්තින්දිවානි -පෙ- තීණි රත්තින්දිවානි -පෙ- ද්වෙ රත්තින්දිවානි -පෙ- එකං රත්තින්දිවං එකන්තසුඛපටිසංවෙදී විහරිතුන්ති? නො හිදං ආවුසො.

25. අහං ඛො ආවුසො නිගණ්ඨා, පහොමි අනිඤ්ජමානො කායෙන අභාසමානො වාචං එකං රත්තින්දිවං එකන්තසුඛපටිසංවෙදී විහරිතුං. අහං ඛො ආවුසො නිගණ්ඨා, පහොමි අනිඤ්ජමානො කායෙන අභාසමානො වාචං ද්වෙ රත්තින්දිවානි -පෙ- තීණි රත්තින්දිවානි -පෙ- චත්තාරි රත්තින්දිවානි -පෙ- පඤ්ච රත්තින්දිවානි -පෙ- ඡ රත්තින්දිවානි -පෙ- සත්ත රත්තින්දිවානි එකන්තසුඛපටිසංවෙදී විහරිතුං. තං කිං මඤ්ඤථාවුසො නිගණ්ඨා, එවං සන්තෙ කො සුඛවිහාරිතරො රාජා වා මාගධො සෙනියො බිම්බිසාරො අහං වාති? එවං සන්තෙ ආයස්මාව ගොතමො සුඛවිහාරිතරො රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙනාති.

ඉදමවොච භගවා. අත්තමනො මහානාමො සක්කො භගවතො භාසිතං අභිනන්දීති.

**චූළදුක්ඛක්ඛන්ධසුත්තං චතුත්ථං.**

---

1. එකන්තසුඛං පටිසංවෙදී, මජසං

Free Distribution www.aathaapi.org

21, " ඇවැත්නි, ගොයුම්ගොතුවෙනි, සුඛයෙන් සුඛය අධිගන්තව්‍ය නො වේ. දුඃඛයෙන් මැ සුඛය අධිගන්තව්‍ය වේ. ඇවැත්නි, ගොයුම් ගොතුවෙනි, සුඛයෙන් සුඛය අධිගන්තව්‍ය වේ නම්, මගධෙශ්වර වන, දකුම්කලු අත්බැව් ඇති, සෙනියරජ සුඛය ලබන්නේ යැ. මගධෙශ්වර වන බිම්බිසාර සෙනිය රජ ආයුෂ්මත් ගොයුම් ගොතුවනට වඩා අත්‍යර්ථයෙන් සුඛවිහාර ඇතියේ යැ" යි ආයුෂ්මත් නුවටුන් විසින් එකාන්තයෙන් මැ ලාහෙලා නුවණින් නොසලකා බසෙක් කියන ලද.

22. වැලිදු මම මැ එකරුණෙහි ලා (තොප විසින්) පිළිවිසිය යුතුයෙමි. කෙසේ ය: "ආයුෂ්මතුන් දෙදෙනා අතුරින් කවරෙක් නම් අධිකතර සුඛවිහරණ ඇතියේ වේ ද, මගධෙශ්වර බිම්බිසාර සෙනියරජ හෝ ආයුෂ්මත් ගොයුම්ගොතු හෝ?" යි.

23. "ඇවැත්නි, ගොයුම්ගොතුවෙනි, සුඛයෙන් සුඛය අධිගන්තව්‍ය නො වේ. දුඃඛයෙන් මැ සුඛය අධිගන්තව්‍ය වේ. ඇවැත්නි, ගොයුම්ගොතු-වෙනි, සුඛයෙන් සුඛය අධිගන්තව්‍ය වේ නම් මගධෙශ්වර වන, දකුම්-කලු අත්බැව් ඇති, සෙනියරජ සුඛය ලබන්නේ ය. ආයුෂ්මත් ගොයුම් ගොතුවනට වඩා මගධෙශ්වර බිම්බිසාර සෙනියරජ අධිකසුඛවිහරණ ඇතියේ යැ" යි ඇවැත්නි, ගොයුම්ගොතුවෙනි, අප විසින් එකාන්තයෙන් මැ ලාහෙලා නුවණින් නොසලකා බසෙක් කියනලද මැයි. වැලිත් තෙල තිබේවා. දැන් වේව යි අපි ආයුෂ්මත් ගොයුම්ගොතුවන් විචාරම්හ: "ආයුෂ්ම-තුන් දෙදෙනා අතුරින් කවරෙක් නම් අධිකසුඛවිහරණ ඇතියේ වේ ද, මගධෙශ්වර බිම්බිසාර සෙනියරජ හෝ ආයුෂ්මත් ගොයුම්ගොතු හෝ?" යි.

24. ඇවැත්නි, නුවටුනි එකරුණින් තොප මැ එයිලා පුළුවුසුම්හ: යම් පරිදි තොපට රිසියේ ද, එපරිදි එය පවසව. ඇවැත්නි, ඒ කිමැ යි හඟනාව? මගධෙශ්වර බිම්බිසාර සෙනියරජ කයින් නොසැලෙමින් තෙපුල් නොබෙණෙමින් සත් දවරැයක් නරතුරු සුව විඳුනාසුලු වැ විහරණ කරන්නට හැකියේ ද? ඇවැත්නි, මේ නොහැකි යැ. ඇවැත්නි, ඒ කිමැයි හඟනාව? මගධෙශ්වර බිම්බිසාර සෙනියරජ කයින් නොසැ-ලෙමින් තෙපුල් නො බෙණෙමින් දවරැය සයක්...විහරණ කරන්නට හැකියේ ද?... දවරැය පසක්.. දවරැය සතරක් ... දවරැය තුනක්... දවරැය දෙකක්...එක් දවරැයක්... නරතුර සුව විඳුනාසුලු වැ විහරණ කරන්නට හැකියේ ද? ඇවැත්නි, මේ නොහැකි යැ.

25. ඇවැත්නි, නුවටුනි, මම වනාහි කයින් නොසැලෙමින් තෙපුල් නොබෙණෙමින් එක් දවරැයක් නරතුරු සුව විඳුනාසුලු වැ විහරණ කරන්-නට හැකියෙමි. ඇවැත්නි, නුවටුනි, මම වනාහි කයින් නොසැලෙමින් තෙපුල් නොබෙණෙමින් දවරැය දෙකක්... දවරැය තුනක්... දවරැය සතරක්... දවරැය පසක් ... දවරැය සයක්... දවරැය සතක් නරතුරු සුව විඳුනාසුලු වැ විහරණ කරන්නට හැකියෙමි. ඇවැත්නි නුවටුනි, ඒ කිමැ යි සිතන්නාව? මෙසෙයින් වත් මැ කවරෙක් නම් අධික සුඛවිහරණ ඇතියේ වේ ද, මහධෙශ්වර බිම්බිසාර සෙනියරජ හෝ යැ, මම් හෝ ය? මෙසෙයින් වත් මැ මගධෙශ්වර බිම්බිසාර සෙනියරජුට වඩා ආයුෂ්මත් ගොයුම්ගොතුවෝ අධික සුඛවිහරණ ඇතියහ යි.

භාග්‍යවතුන් වහන්සේ මෙසුත වදාළහ. සතුටුසිත් ඇති මහානාම සැහැරජ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිමුඛ කොට පිළි-ගත්තේ යැ.

**චූලදුක්ඛක්ඛන්ධසූත්‍රය සතරවැනි යි.**